කරුණාරත්න, එම්. එස්. එම්. එල්.
විජේපාල, එස්. යූ.
මෙන්ඩිස්, ඒ.
PAPER

**ජංගම දූරකථන සමාජ සබඳතා සහ අධ්‍යාපනය: පාසල් සිසුන්ගේ උපකාරක පන්ති ක්‍රියාකාරකම් ඇසුරින් කෙරෙන අධ්‍යනයකි**

එම්. එස්. එම්. එල්. කරුණාරත්න, භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව, රුහුණ විශ්වවිද්‍යාලය
එස්. යූ. විජේපාල, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, රුහුණ විශ්වවිද්‍යාලය
ඒ.මෙන්ඩිස්, පශ්චාත් උපාධි පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය

මේ වන විට ජංගම දූරකථන භාවිතය හුදෙක් තාක්ෂණික මෙවලමක් පමණක් නොව ආර්ථික දේශපාලනික සමාජයීය හා සංස්කෘතිකමය වශයෙන් පුද්ගල ආකල්ප හා හැසිරීම් කෙරෙහි ද සෘජුවම බලපෑම් කර තිබේ. 1980-90 දශක වලට පසුව ලංකාවේ ජංගම දූරකථන භාවිතය සීඝ්‍ර ලෙස ඉහළ යාමක් හඳුනාගත හැකි අතර එය භාවිත කරන පිරිස සුපිරි ධනවතුන්ගේ සිට අන්ත දිළින්ඳන් දක්වා පරාසයක විහිදේ.

මෙම අධ්‍යයනය ඉලක්කගත වන්නේ පාසල් යන වයස් කාණ්ඩයේ යෞවන යෞවනියන් ය. ජංගම දූරකථන භාවිතය ඔවුන්ගේ සමාජ සබඳතා හා අධ්‍යාපනික ක්‍රියාකාරකම් කෙරෙහි සිදුකර තිබෙන බලපෑම මෙහිදී විශ්ලේශනය කෙරේ.ගාල්ල නගරයේ ප්‍රධාන පෞද්ගලික උපකාරක පංතියක අ.පො.ස. උසස් පෙළ කලා විෂය ධාරාව හදාරන අහඹු ලෙස තෝරාගත් සිසුන් 150 දෙනෙකුගෙන් ප්‍රශ්නාවලී සමීක්ෂණයෙන් තොරතුරු රැස්කරන ලද අතර සම්මුඛ සාකච්ඡා, දූරකථන සම්මුඛ සාකච්ඡා සහ සෘජු නිරීක්ෂණය ද අධ්‍යයන ක්‍රමවේදයන් ලෙස භාවිත කරන ලදී. තෝරාගත් නියැඳිය අම්බලන්ගොඩ, ගාල්ල, උඩුගම, දෙල්ලව, නෙළුව, හික්කඩුව, බූස්ස ආදී ප්‍රදේශ නියෝජනය කරයි. ප්‍රශ්නාවලී සමීක්ෂණයට සහභාගි වූ සිසුන්ගෙන් 64% ජංගම දූරකථන භාවිත කරන අතර ඉන් 70% ක් සිසුවියන් වේ. සිසුන්ට (සිසුවියන් ද ඇතුළුව)තම ජංගම දූරකථන ලැබී ඇත්තේ දෙමාපියන්ගෙන් වන අතර එය 66%ක අගයක් ගනී. ඒ ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු වඩාත් පහසු වනු පිණිස ය. නමුත් එම සිසුන්ගෙන් 57% ක් පිළිගන්නේ ජංගම දූරකථනය තම අධ්‍යාපන කටයුතුවලට බාධාවන බවකි. සමාජ සබඳතාවල වර්ධනයක් ද මේ සමඟ සිදුව ඇති බව 45%ක් පිළිගනී. මෙතුළින් ගොඩනැගී ඇති ඇතැම් සමාජ සබඳතා සිසුන්ගේ දෛනික ජීවිතයට පවා අගතිගාමී ලෙස බලපා තිබෙන බව සම්මුඛ සාකච්ඡාවලදී අනාවරණය විය. සාධනීය හා නිශේධනීය විචල්‍යයන් කෙරෙහි අවධානය යොමු කරමින් ජංගම දූරකථන භාවිතය වඩා ප්‍රශස්ත ලෙස අධ්‍යාපනික සහ සමාජ සබඳතා සංවර්ධනයේ දී යොදාගත හැකි ආකාරය මෙම අධ්‍යයනයේ දී හඳුනා ගැනීමට උත්සාහ ගනී.